ඇමෙරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය

කොළඹ

පුවත්පත් නිවේදනය

මහජන කටයුතු අංශය

දුරකථන : +94 (1) 249-8100 ● ෆැක්ස් : +94 (1) 244-9070

ඊමේල් : VanHornNT@state.gov * http://lk.usembassy.gov

නිවේදන අංක . 20171025

මානුෂීය ප්‍රතිචාර දැක්වීම් සවිමත් කිරීම සඳහා USAID මගින් අන්තර් ආගමික සංසදය වෙත සහාය සලසනු ලැබේ.

ඔක්තෝබර් 25 , කොළඹ - කොළඹදී පැවති මානුෂීය අවශ්‍යතාවයන් සඳහා ප්‍රතිචාර දැක්වීමේ දේශීය අවස්ථා නිර්මාණය කිරීම සහ ආගම් හා ආගමික විශ්වාස පදනම් කොටගත් සංවිධානවල භූමිකාව පිළිබඳ සංසදය සඳහා රටවල් 36කින් සහභාගි වන්නන් 140 දෙනෙකුට වැඩි ප්‍රමාණයකට සම සත්කාරකත්වය සපයමින්, ඔක්තෝබර් මස 16-19 දක්වා කාලය තුළ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය (USAID) මගින් සංවිධාන අතර හවුල්කාරිත්වය සහ දේශීය මානුෂීය ප්‍රතිචාර දැක්වීම් සවිමත් කරන ලදී. දේශීය සහ ගෝලීය ආගමික විශ්වාස ජාලයන්, ආගමික විශ්වාස පාදක කොටගත් සහ අනාගමික සංවිධාන, සහාය නියොජිතායතන, ප්‍රතිපත්ති සම්පාදකයින් සහ රජයන් නියෝජනය කරමින්, සහභාගි වන්නන් විසින් සාකච්ඡා කරන ලද්දේ ප්‍රජා සහ ආගමික විශ්වාස පදනම් කොටගත් ක්‍රියාකාරීන් සහ ජාලයන් තුලින් දේශීය වශයෙන් කටයුතු කිරීම තුළින් ආපදාවන් අත්දකිමින් සිටින ප්‍රජාවන් වෙත සහාය සැලසීම වැඩි දියුණු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳවයි.

ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා USAID අධ්‍යක්ෂ, ආචාර්ය ඇන්ඩෲ සීසන් මහතා මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් සඳහන් කරන ලද්දේ, ආගමික විශ්වාසයන් පදනම් කොටගත් සහ අනාගමික යන දෙවර්ගයේම දේශීය සංවිධාන සමග සෘජුව වැඩකටයුතු කිරීමේ USAID ශ්‍රී ලංකා ආයතනය සතු දීර්ඝ ඉතිහාසය පිළිබඳවයි. 'දේශීය ප්‍රජාවන් සම්බන්ධ කරවාගැනීම මගින් ජනතාවගේ ප්‍රත්‍යක්ෂ අවබෝධයන් සහ අවශ්‍යතාවයන් ඔවුන්ගේ සන්දර්භයන් යනාදිය පිළිබඳව ගැඹුරු අවබෝධයක් අප වෙත නිර්මාණය වන අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, සාධනීය සහ තිරසාර විසඳුම් සොයාගැනීමේ ඉහළ හැකියාවක් පවතී.' 'වසර කිහිපයකට පෙර USAID හි පිරිසැරුම් ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍රයේ ප්‍රධාන අංගයක් වූයේ ස්ථානීය (දේශීය) වශයෙන් ක්‍රියා කිරීම වූ අතර එහිදී හැකියාව පවතින සෑම විටමදේශීය විසඳුම් සහ හවුල්කාරිත්වයන් සොයාගැනීම මගින්

අපගේ සංවර්ධන වැඩසටහන්වල සාධනීයභාවය ඉහළ නැංවීමට අපි කටයුතු කරමු' යනුවෙන් ඔහු වැඩිදුරටත් පැවසීය.

මානුෂීය ආධාර සැපයීම වැඩිදියුණු කිරීම සඳහා පවතින අභියෝගයන් ආමන්ත්‍රණය කිරීම, යහ පරිචයන් බෙදා හදා ගැනීම සහ සාක්ෂි මත පදනම් වූ නිර්දේශ ඉදිරිපත් කිරීම මෙම තෙදින වැඩසටහන මඟින් සිදුවිය. මෙයට ඇතුළත් වූ මාතෘකා වූයේ 'ගැටුම සහ සාමය ගොඩනැගීම' ආපදා වලට ප්‍රතිචාර දැක්වීම, සරණාගතයින් සහ බල කරන ලද සංක්‍රමණය, ආපදා අවදානම් අවම කිරීම සහ ආපදා ප්‍රත්‍යස්ථිතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය සහ ළමයින් හා සෞඛ්‍යය යනාදියයි. මානුෂීය වැඩකටයුතු වල සියළුම පැතිකඩ තුළ, ආගමික විශ්වාස ජාලයන් ඔසසේ කාන්තාවන්ගේ මැදිහත්වීම ලබාගැනීමේ වැදගත්කම සහභාගිවන්නන් විසින් අවධාරණය කරන ලදී.

සංසදය අවසානයේදී, ගෝලීය, ජාතික සහ ප්‍රාදේශීය මට්ටම් වලදී සිදු කළ යුතු ප්‍රධාන ක්‍රියාවන් විශේෂයෙන් සඳහන් කළ ක්‍රියාකාරීවීම සඳහා වන උපදෙස් / උත්තේජන සහභාගිවන්නන් හට දායාද කරනු ලැබීය. අනෙකුත් මානුෂීය ක්‍රියාකාරීන් සහ හවුල්කරුවන් හට ආගමික විශ්වාසයන් පිලිබඳව දේශීය ක්‍රියාකාරින්ගේ වැඩ කටයුතුවලට සම්බන්ධ වී ක්‍රියා කිරීමට අවශ්‍ය පිවිසුම් අංශද මෙමගින් හඳුනාගන්නා ලදී. ආදර්ශයන් සහ යහපරිචයන් බෙදා හදා ගැනීමට, වලංගු සහ තහවුරු වූ අත්දැකීම් ග්‍රහණය කර ගැනීමට සහ රජයන් වෙනුවෙන් පක්ෂව කටයුතු කිරීමට තව තවත් අවස්ථා වැඩි දියුණු කළ යුතුය යන්න අපගේ නිර්දේශය විය. මානුෂීය ප්‍රතිචාර දැක්වීමේදී ඉදිරිය ගෙන කටයුතු කිරීමට හැකි වන අයුරින් දේශීය ආගමික විශ්වාස ප්‍රජාවන් ඇතුළුව දේශීය සංවිධානයන් වෙත මූල්‍යමය වශයෙන් සහාය සැලසීමේ සහ අවදානම් සඳහා සූදානම තුළ විවිධ වූ ප්‍රජාවන් එකට එක්තැන් කිරීමේ අවශ්‍යතාවය ද මෙහිදී වැදගත් වේ.

USAID ආයතනය මඟින් සම සත්කාරකත්වය සැපයූ මෙම සංසදය, මහාබෝධි සංගමයේ සභාපති පූජ්‍ය බානගල උපතිස්ස හිමි සහ ජාතික ක්‍රිස්තියානි සභාවේ ප්‍රධානී, පූජ්‍ය එබෙනසර් ජෝසප් යන අය විසින් සභාපතිත්වය දරන ශ්‍රී ලංකාවේ සියලුම ආගමික විශ්වාසයන්ගේ නියෝජනය සහිත දේශීය සත්කාරක කමිටුව සහ ආගමික විශ්වාස සහ සංවර්ධන සැලසුම් කමිටුවේ ජාත්‍යන්තර හවුල්කාරිත්වය මඟින් සංවිධානය කරන ලදී.